# බලන්ගොඩ නගර සභාව
## <u>ටෙන්ඩර් දැන්වීම</u>

**බලන්ගොඩ නගර සභාවට අයත් පොදු වෙළදසැල අංක 05 දරණ එළවළු කඩ කාමරය සඳහා සුදුසු බදුකරුවෙකු තෝරා ගැනීම සඳහා ටෙන්ඩර්පත් කැඳවීම.**

2025 ඔක්තෝම්බර් 01 වන දින සිට ඉදිරි කාල සීමාව සඳහා පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දේපළ බදු දීම වෙනුවෙන් මුද්‍රා තබන ලද ලංසු අයදුම්පත් බලන්ගොඩ නගර සභාවේ සභාපති කංකානම් ගමගේ පේමදාස වන මා විසින් 2025 සැප්තැම්බර් 23 වන දින පෙ.ව.10.00 දක්වා භාරගනු ලැබේ. වැඩි විස්තර සතියේ වැඩ කරන දිනයන්හි වැඩ කරන වේලාව තුළ දී කාර්යාලීය දුරකථන අංක 045-4930830 ඇමතීමෙන් හෝ info@balangoda.uc.gov.lk වෙතින් ලබා ගත හැකිය.

**ලංසුපත් නිකුත් කිරීම**

2025 සැප්තැම්බර් 22 වන දින ප.ව.3.00 දක්වා ලංසුපත් බලන්ගොඩ නගර සභා කාර්යාලයේදී නිකුත් කරනු ලැබේ.

**ලංසුපත් භාර ගැනීම**

2025 සැප්තැම්බර් 23 වන දින පෙ.ව.10.00 දක්වා ලංසුපත් භාරගනු ලැබේ. ලංසු අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ලංසු අයදුම්පත් කාර්යාලයේ තැන්පත් කර ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලීම හෝ **සභාපති/ලේකම්, බලන්ගොඩ නගර සභාව** යන ලිපිනයට 2025 සැප්තැම්බර් 23 වන දින පෙ.ව.10.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ යොමු කළ හැකිය. නියමිත වේලාවට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලංසුපත් විවෘත කිරීම**

2025 සැප්තැම්බර් 23 පෙ.ව.10.30 ට ලංසුපත් විවෘත කරනු ලැබේ. මෙම අවස්ථාවට ලංසු අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයෙකුට හෝ සහභාගී විය හැකිය.

**උපලේඛනය**

| අනු අංකය | ලංසුපත් කැඳවනු ලබන වෙළඳාමේ ස්වභාවය | ආපසු ගෙවනු ලබන ලංසු ඇප තැන්පත් මුදල | අයදුම්පත් ගාස්තුව | අවම මාසික ලංසු මුදල |
|---|---|---|---|---|
| 01. | පොදු වෙළෙදසැල අංක 05 දරන එළවළු කඩ කාමරය | රු.5,000.00 | රු.1,000.00 | රු.12,500.00 |

**විශේෂ කොන්දේසි.**

- ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ තමා ඉදිරිපත් කරනු ලබන ලංසුවේ නම සඳහන් කළ යුතුය.
- ඉදිරිපත් කරන ලංසුවට අදාල ඉහත උප ලේඛනයේ සඳහන් ගාස්තු ද, රජය විසින් පනවනු ලබන බදු මුදල්ද ගෙවිය යුතුය.
- තෝරා ගන්නා ලද බදු කරු ගිවිසුම් ඇප තැන්පත් මුදල් වශයෙන් මාස තුනක කුලී මුදලට සමාන මුදලක් සභාවට ගෙවිය යුතු අතර, එය වාරික දෙකක් වශයෙන් බලන්ගොඩ නගර සභාවට ගෙවිය හැකිය. එම මුදලින් තුනෙන් එකක් නොහොත් මසක කුලිය බදුකරු තෝරා ගෙන පළමු පැය තුළ ගෙවිය යුතුය. එසේ නොගෙවන බදුකරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉතිරි කොටස් දෙක නොහොත් මාස දෙකක කුළිය එකවර ගෙවා 2025.09.30 දින වන විට ගිවිසුම් අත්සන් කළ යුතුය.
- ටෙන්ඩරය පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බලන්ගොඩ නගර සභාවේ ටෙන්ඩර් මණ්ඩලය සතුය.

2025 සැප්තැම්බර් 04 වන දින,
බලන්ගොඩ නගර සභාවේදීය.

කේ.ජී. පේමදාස,
සභාපති,
බලන්ගොඩ නගර සභාව.